# ශ්‍රී ලංකවේ ඓතිහාසික දේශපාලන භාවිතාවන් නූතන දේශපාලන හා ආණ්ඩුකරණය කෙරෙහි සිදුකරන බලපෑම

## (විජය රජුගේ සිට අනුරාධපුර යුගය අවසානය දක්වා පාලන කාලය ඇසුරින්)

ජේ.ඒ.දුලාංජලි රාජකරුණා[11]


## සංක්ෂේපය

සාමාන්‍යයෙන් විද්වතුන් පිළිගන්නා කරුණක් නම් මෙරට දේශපාලන ආණ්ඩු බිහිවීමේ ඉතිහාසය ආරම්භ වන්නේ ආර්යය සංක්‍රමණයෙන් පසු බව ය. නමුත් ඊට පෙර මෙරට යම් ආකාරයක දේශපාලන රටාවක් තිබුණු බවට තොරතුරු පවති. ඒ කෙසේ නමුදු මෙරට ශ්‍රී ලංකා රජකු යටතේ දේශපාලන ක්‍රමයක් ආරම්භ වුයේ; පණ්ඩුකාභය රජුගේ පාලන කාලය තුළයි. මුළු ලක්දිව ම ප්‍රථම වරට එක්සේසත් කරමින් දේශපාලන ආධිපත්‍ය දිනාගැනිමට හැකි වූයේ, දුටුගැමුණු රජුගේ පාලන කාලයේදී ය. මේ ආකාරයට විකාශනය වු ශ්‍රී ලාංකාවේ දේශපාලන හා ආණ්ඩු ඉතිහාසය විමසා බැලිම හා ඒම දේශපාලන භාවිතාවන් වර්තමාන දේශපාලනයට හා ආණ්ඩුවට බලපා ඇති ආකාරය අධ්‍යයනය කිරිම මෙම ලිපියේ අරමුණයි. මෙහිදි ද්විතියීක දත්ත භාවිතා කරමින් ඓතිහාසික හා විස්තරාත්මක ක්‍රමවේදය පදනම් කර ගනිමින් විශ්ලේෂණය කරන ලදි. මෙම විශ්ලේෂණයේ නිගමනය වන්නේ, ශ්‍රී ලංකාවේ දේශපාලන අතීතය වර්තමාන දේශපාලන තත්ත්වයන්, දේශපාලන ප්‍රවණතා කෙරෙහි බලපා ඇති බවයි.


**මුඛ්‍ය පදඃ** *අනුරාධපුර යුගය, ආණ්ඩුව, රාජ්‍ය පාලනය, දේශපාලනය*

## හැඳින්විම

විජය රජුගේ සිට අනුරාධපුර යුගය අවසානය දක්වා දේශපාලන හා ආණ්ඩු ඉතිහාසය පිළිබඳ සාකච්ඡා කිරිමේදී එම කාල පරාසය දේශපාලනමය වශයෙන් ඉතා වැදගත් කාල පරාසයක් වේ. මහාවංශය, දීපවංශය, චූලවංශය, යන ප්‍රාථමික මුලාශ්‍ර තුළින් ද, විදේශිය මුලාශ්‍ර තුළින් මෙන් ම පුරවිද්‍යාත්මක සාධක මගින් ද ඉතිහාසයේ බොහෝ කරුණු හැදෑරිය හැකි ය. එම මූලාශ්‍ර තුළින් මෙරට ඉතිහාසය තුළ දේශපාලන විකාශනය කිනම් ආකාරයකින් ක්‍රියාත්මක වුයේ ද යන්න මනාව අනාවරණය වේ. මෙරට දේශපාලන ඉතිහාසයේ වැදගත් ඓතිහාසික සිදුවීම් රැසක්ම අනුරාධපුර පාලන කාලය තුළ සිදු විය. රාජාණ්ඩු ක්‍රමයේ මූලාරම්භය වන්නේ ද අනුරාධපුර යුගයේ වන අතරම ශක්තිමත් දේශපාලන ක්‍රමයක් හා ආණ්ඩු ක්‍රමයක් එම යුගය තුළ පැවති ඇති බවට සාක්ෂි පවති. අවුරුදු 1400ක් පමණ දීර්ඝ ඉතිහාසයක් අනුරාධපුර යුගයට අයත් වේ. පණ්ඩුකාභය, දුටුගැමුණු, වලගම්බා වැනි රජවරු අනුරාධපුර යුගයේ දේශපාලනමය වශයෙන් වැදගත් රජවරු විය. ශ්‍රී ලංකාවේ ඉතිහාසය අධ්‍යනය කිරීම සඳහා භාවිතා කරනු ලබන මූලාශ්‍ර ඇසුරු කිරීමේ දී පෙනී යන්නේ ශ්‍රී ලංකාවේ පිහිටීම මෙන් ම, ඒ පදනම් කරගනිමින් ඉතිහාසය තුළ ගොඩනැගුණු දේශපාලන භාවිතාවන් පසුකාලීනව සෘජුවම ශ්‍රී ලංකාවේ දේශපාලනය හා ආණ්ඩුකරනයට බලපා ඇති බවයි. ඒ පිළිබඳව වඩාත් ගැඹුරින් ලිපියේ ඉදිරි පරිච්ජේදවල දී අධ්‍යයනය කරනු ලැබේ.

### ශ්‍රී ලංකාවේ භූගෝලීය පිහිටීම දේශපාලන ඉතිහාසය ගොඩනැංවීමට බලපෑම් කළ ආකාරය

ශ්‍රී ලංකාව ප්‍රධාන දූපතකින් හා ඒ අසල පිහිටා ඇති කොදෙව් කීපයකින් ද, යුක්ත වෙයි. එය දකුණු ආසියාවේ ඇති විශාලම දූපත යි. ශ්‍රී ලංකාව උත්තර අක්ෂාංශ 5’55’ , 9’51, සහ නැගෙනහිර දේශාංශ 79’52, අතර ඉන්දියානු අර්ධද්වීපයට දකුණින්, ඉන්දියාවෙන් වෙන්ව පිහිටා ඇත.

[11] ශාස්ත්‍රවේදි දේශපාලන විද්‍යා (විශේෂ) පළමු වසර

ඉන්දියාවෙන් වෙන්ව ඇත්තේ කිලෝමීටර තිස් දෙකක් පමණ වූ පටු මුහුදු තීරයකි (රණවැල්ල, 2009, 22-23)

පහතින් දක්වා ඇති භූගෝලීය ලක්ෂණ ශ්‍රී ලංකාවේ දේශපාලන ඉතිහාසය ගොඩනැඟීමට හේතු වී ඇත.

i. ඉන්දියාවට ආසන්නව පිහිටීම
ii. කුඩා සමුද්‍ර තීරයකින් ඉන්දියාවෙන් වෙන්ව පිහිටා තිබීම
iii. ඉන්දියන් සාගරයේ වැදගත් කේන්ද්‍රස්ථානයක පිහිටා තිබීම
iv. කුඩා දූපතක් වීම

ශ්‍රී ලංකාව ඉන්දියාවට සමීපයෙන් පිහිටීම නිසා ඉන්දියාවේ ඇති වූ තීරණාත්මක සිදුවීම් බොහෝමයක බලපෑම ශ්‍රී ලංකාව කෙරෙහි එල්ල විය. ඉන්දියාවෙන් ආර්යයන් ලංකාවට පැමිණීම,. වරින් වර සංක්‍රමණිකයන් ලංකාවට පැමිණීම සහ පරිපාලන නිලධාරින් හඳුන්වා දී ඇත්තේ එකල ඉන්දියාවේ පරිපාලන නිලධාරින් සඳහා භාවිතා වූ රජ, යුව රජ, මහා ඇමති, පුරෝහිත තනතුරු නාම අනුවම ය. රාජාභිෂේක ක්‍රමය ද ඔවුන් මුල දී භාවිතා කළ 'දෙවනපිය' යන විරුද නාමය ද, මෙරටට හඳුන්වා දෙන ලද්දේ ඉන්දියානුවන් විසිණි. අනුරාධපුර යුගයේ රාජ්‍ය උරුමය සඳහා යුද්ධ ඇති වූ ඇතැම් අවස්ථාවල දී අපේ රජවරුන් ඉන්දියාවට ගොස් කුළී යුද හමුදා ගෙනවුත් එකිනෙකා සටන් වැදුණු බව සඳහන් වේ. ඉන්දියාවට නුදුරින් පිහිටා තිබීම නිසා මෙරට ආවේණික වූ දේශපාලන රටාවක් හා පාලන තන්ත්‍රයක් මෙහි ඇති විය. පුරෝහිත බමුණන් පත් කර ගැනීම එකල ඉන්දියාවේ පැවති සිරිත වුවත් මෙරට එකල ඒ සඳහා යොදා ගනු ලැබුවේ භික්ෂූන් වහන්සේලා ය. සහෝදරයාගෙන් සහෝදරයාට වැඩිමහලු සහෝදරයාගෙන් වැඩිමහලු පුත්‍රයාට ආදි වශයෙන් රජකම උරුම වීය. තව ද, මේ රට ප්‍රධාන මුහුදු මාර්ග සන්ධිස්ථානයක පිහිටා තිබීම නිසා මෙරටට පැමිණි අසල්වැසි රටවල වෙළෙඳුන් විසින් මෙරට ජනාවාස ඇති කොට පසු ව රාජාණ්ඩු ද, පිහිටවා ගන්නා ලද බව සඳහන් වේ. අභ්‍යන්තර භූ විෂමතා ලක්ෂණ හා භූ විෂමතාවල බලපෑම ද, දේශපාලන ඉතිහාසය කෙරෙහි බලපාන ලදී. මහවැලි, කළු, කැලණි, කලා, දැදුරු ආදි වූ ගංගා මෙරට දේශපාලන ඉතිහාසය කෙරෙහි බලපා ඇති බව දැකිය හැකි ය. ජනපද පිහිටුවා ගැනීමේ දී ගංගා ආශ්‍රිතව පිහිටුවා ගන්නා ලදි. ශ්‍රී ලංකාව දේශපාලන වශයෙන් හෝ පරිපාලන පහසුව තකා හෝ කොටස් වශයෙන් බෙදා ගත් අවස්ථාවලදි මෙරට පිහිටි ඇතැම් ගංගා බලපා ඇති බව පෙනේ. මෙරට කඳු පර්වත මෙහි දේශපාලන ඉතිහාසය කෙරෙහි බලපා ඇත්තේ ය. දේශපාලන වියවුල් අවස්ථා කාලවල රජවරු ආරක්ෂාව පතා කඳු පර්වත වල රාජධානි පිහිටුවාගෙන ඇත. දකුණු ඉන්දියානු ආක්‍රමණ එල්ල වී සිංහල රජවරුනට පරාජය අත්වූ බොහෝ අවස්ථාවල ඔවුන් ආරක්ෂාව පතා පලා ගොස් ඇත්තේ කඳු රටට ය. රට ප්‍රමාණයෙන් කුඩා වීම ද, දේශපාලන ඉතිහාසය කෙරෙහි බලපා ඇති බව දැකිය හැකි ය. අනුරාධපුර රාජධානිය පිහිටුවා ගත් පණ්ඩුකාභය රජු තමාගේ දස වන වර්ෂයේ දී මුළු ලක්දිවෙහි ග්‍රාම සීමා නියම කළ බව සඳහන් වේ. මෙරට ජනාවාස ඇති කොට සුළු කලක් ගත වීමත් සමඟ මුළු දිවයිනම එක්සත් කිරීමට හැකි වුයේ රටේ කුඩා නිසා ය (රණවැල්ල, 2009).

## විජය රජුගේ සිට අනුරාධපුර යුගයේ අවසානය දක්වා මෙරට දේශපාලන ඉතිහාසය

අනුරාධපුර යුගය වශයෙන් සැලකෙන්නේ, ක්‍රි.පූ 6 වන සියවසේ විජය කුමාරයාගේ සිට රාජ්‍ය අවසාන පාලකයා වූ පස්වන මිහිඳු රජු ක්‍රි . ව 1017 දී ඉන්දියානු සොලි රජවරුන්ගේ සිරකරුවකු බවට පත් වූ දිනය දක්වා අවු 1400ක් දීර්ඝ කාල පරිච්ඡේදයකි (රණවැල්ල, 2009, 80-81). සාමාන්‍යයෙන් විද්වතුන් පිළිගන්නා කරුණක් නම් ශ්‍රී ලංකාව ශිෂ්ට ජනාවාස ඇති වුයේ ආර්ය සංක්‍රමණයෙන් පසු බව යි. කෙසේවෙතත්, මෙරට ශ්‍රී ලංකාවේ රජකු යටතේ පාලන සංවිධානයක් මුලින්ම ආරම්භ වූයේ අනුරාධපුර යුගයේ ප්‍රථම පාලකයා වූ පණ්ඩුකාභය රජුගේ පාලන කාලය තුළයි. මොහු ග්‍රාම සීමා කරමින් අනුරාධපුර නගරය නිර්මාණය කළ බව මහාවංශයේ සඳහන් වේ. එසේම ශ්‍රී ලංකා ඉතිහාසය තුළ පළමු වතාවට අභිෂේක මංගල්‍ය උත්සවය ආරම්භ කළේ මොහුය. විශේෂයෙන්ම සංවිධිත රාජාණ්ඩු ක්‍රමයක ආරම්භය සිදු වීමත්, මුළු ශ්‍රී ලංකාවේම නොවුවත්

විශාල ප්‍රදේශයක දේශපාලන ආධිපත්‍ය ලබාගත් පාලකයකු වීම ද පණ්ඩුකාභය රජතුමා විශේෂ වීමට හේතුවකි. රාජාණ්ඩු පාලන ක්‍රමයේ තවත් වැදගත් අවස්ථාවක් වන්නේ දේවානම් පියතිස්ස රජුගේ පාලන සමයයි. මෙය ක්‍රි.පූ 250-210 දක්වා කාලය වෙත දිව යයි. "දෙවනපිය" විරුද නාමය ලැබුවේ ද, මොහුය. මෙරට ඉතිහාසයේ වැදගත් සන්ධිස්ථානයක් වන බුදු දහම ලංකාවට ගෙන ඒම මෙම කාලයේ සිදු විය. ආර්ථික, සාමාජීය, ආගමික, වශයෙන් මෙම යුගය වෙනස්කම් සිදු විය (රණවැල්ල, 2009, 83-84). කාවන්තිස්ස රජුගේ කාලය ද, දේශපාලනමය වශයෙන් වැදගත් වේ. ගොවිතැන් කටයුතු දියුණු කරමින් යුද ශක්තියෙන් සන්නද්ධව ඔහු රට පාලනය කළහ. කාවන්තිස්ස රජුගෙන් පසු ඔහු ගේ පුත් දුටුගැමුණු රජු රාජ්‍ය පාලනය කළහ. එළාර රජු පරදවමින් මුළු ශ්‍රී ලංකාවම එක්සේසත් කළ රජ කෙනෙකු ලෙස දුටුගැමුණු රජු හැඳින්විය හැක. පසුව ඔහු රටේ පරිපාලනය සඳහා අවශ්‍ය නිලධාරින් පත්කොට යුක්තිය පසිඳලීම සඳහා අවශ්‍ය අධිකරණ ශාලා විනිශ්චය කරුවන් ද, පත් කළේ ය. පසුව ඔහුගේ බාල සොහොයුරු සද්ධාතිස්ස කුමරු රජකමට පත් විය. දුටුගැමුණු රජුට නිම කළ නොහැකි වු රුවන්වැලි සෑය ඔහු නිම කළහ.

දේශපාලනමය වශයෙන් තවත් වැදගත් අවධියක් ලෙස වළගම්බා රජුගේ කාලය හැඳින්විය හැක. වට්ටගාමිණී අභය රජු මහාරත්ත සෙනෙවියා මරා තම පරපුරට හිමි රාජ්‍ය යළි ලබා ගත්හ. එහෙත් එකළ පැවති දේශපාලන ගැටුම් නිසා ආරක්ෂාව පතා මලය ප්‍රදේශයට පැන ගොස් සේනාව සංවිධානය කර නැවත පැමිණ දකුණු ඉන්දියානු ආක්‍රමණික ද්‍රවිඩ දඨිය රජු මරා නැවත රජකම ලබාගත්හ. ආක්‍රමණිකයන්ට යටත් වු කාලයේ 12 අවුරුද්දක් තිස්සේ මෙරට සාගතයක් පිළිබඳ වංශ කතාවල සඳහන් වේ. මෙය "බැමිණිටියා සාගතය" යනුවෙන් හැඳින් වේ. ත්‍රිපිටක හා අට්ඨකතා ප්‍රථම වරට ලේඛනාරූඪ කෙරුණේ මේ රජුගේ කාලයේය. පසුව, බල්ලාට නාග, මහා චූලී මහා තිස්ස කුමරු, චෝර නාග කුමරු පිළිවලින් රජ වීය. මහා චූලී මහා තිස්ස රජුගේ පුත්‍රයෙකු රජ වී අවුරුදු 3කට පසු චෝර නාග රජුගේ බිසව දුන් වස කා මිය ගිය බව වංශ කතාවල සඳහන් වේ. පසුව අනුලා බිසව වටුක, දාරුභාතික තිස්ස,නිළිය, පිළිවෙළින් රාජ්‍යත්වයට පත් කොට ඔවුන් සියලු දෙනා මරවා තමාට පවරා ගත්හ. කාන්තාවක් ශ්‍රී ලංකා සිංහාසනයට පත් වූ ප්‍රථම අවස්ථාව මෙයයි. පසුව ඇය මරා කුට කණ්නතිස්ස රජ විය. පසුව භාතික තිස්ස, මහා දාඨිය මහා නාග, ආමණ්ඩ ගාමණි අභය කුමරු පිළිවෙළින් රජ විය. ප්‍රථම වරට සතුන් මැරීම තහනම් කලේ මොහුය. මරා කණිරජානු තිස්ස රජ විය. එතෙක් අවුරුදු 70 ක් පමණ පැවති රටේ සාමය බාධා පැමිණ විය. පසුව චුලාභය කුමරු, ඔහුගේ නැගණිය සිවලි කුමරිය රජ විය. ඇය මරා ඉළනාග නම් කුමරෙක් රජ විය. ඔහුගෙන් පසු චන්ද්‍රමුඛසිව හා යසලාලක තිස්ස නම් කුමාරවරුන් දෙදෙනා පිළිවෙලින් රජ විය. ඔහුගෙන් පසු පණ්ඩුකාභය රජුගෙන් ඇරඹෙන ප්‍රථම රාජ්‍ය වංශයට රාජ්‍ය බලය අහිමි විය. ඊළගට රාජ්‍ය බලයට පත් වුයේ, ලම්බකර්ණ වංශිකයන්ය. එහිදි ප්‍රථම වරට යසලාලක රජු මරා රාජ්‍ය බලයට පත් වුයේ ශුභ හෙවත් සබ නම් කුමාරයකි. නමුත් ලම්බකර්ණ වංශයේ ප්‍රථම රජු ලෙස සැලකෙන්නේ ඔහු මරා බලයට පත් වසබ රජුය. මේ රජුගෙන් ඇරඹි රාජවංශය 370 ට වැඩි කාලයක් පැවතිණි. එම අවධිය දේශපාලන වශයෙන් ආර්ථික ආගමික වශයෙන් සංවර්ධනය වු කාල පරිච්ඡේදයකි. අවු 22 කාලයෙන් පසු ලම්බකර්ණ වංශය අවසන් වුයේ දකුණු ඉන්දීය ආක්‍රමණ නිසාය. අවු 27 පමණ කල් අනුරාධපුර රාජ්‍ය අත් පත් කොට ගෙන සිටි ද්‍රවිඩ පාලකයන් පරාජය කර යළිත් නිදහස් කර ගනිමින් රාජ්‍යට පත් වුයේ ධාතුසේන නම් වු මෞර්ය වංශික කුමාරයෙකි. පසුව ඔහුගේ පුත් කාශ්‍යප අතින් රජු මරණයට පත් ව ඇත. කාශ්‍යප රජු රජ වී සිංහාසනයට පත්ව අවු 18 කට පසු මුගලන් කුමරු කාශ්‍යප රජු පරදවා සිංහාසනයට පත් විය. පසුව මොග්ගල්ලාන රජු මහකුමාරදාස, රජු කිර්තිසේන රජු, සිව රජු, පිළිවෙළින් රජ විය. සිව රජුගේ මරණින් පසු දෙවන මෞර්ය රාජවංශය නිමා විය. පසුව දෙවන ලම්බකර්ණ වංශය තෙවන ලම්බකර්ණ රාජ වංශ බිහි විය. අනුරාධපුර රාජධානිය දුර්වල පාලනය හා ද්‍රවිඩ දකුණු ඉන්දියානු ආක්‍රමණ නිසා අනුරාධපුර රාජධානිය බිඳ වැටුණි. අනුරාධපුර අවසාන පාලකයා වු පස්වන මිහිඳු රජුගේ කාලයේ දකුණු ඉන්දියානු චෝළ ආක්‍රමණ නිසා අනුරාධපුර රාජධානිය බිඳ වැටුණි.

## අනුරාධපුර දේශපාලන ඉතාහාසය වර්තමාන දේශපාලනයට හා ආණ්ඩු කෙරෙහි බලපා ඇති ආකාරය

ලංකාවේ රාජ්‍ය සංස්ථාව අරම්භ වූයේ ශ්‍රී ලංකාවට සංක්‍රමණය වු විජය කුමරුගෙනි. නමුත් ඊට පෙර සිට මෙරට රාජ්‍යත්වය පිළිබඳ සංකල්පය පැවති බවට සාක්ෂි ඉදිරිපත් වී තිබේ (සෝමරත්න 2009, 41-42). එහෙත් ක්‍රමාණුකූල පාලනයක් ආරම්භ වූයේ ආර්යය සංක්‍රමණයෙන් පසුව බව කිව හැකිය. වර්තමානය දක්වා රාජ්‍ය පාලනය කිරිමේ මූලාරම්භයම මෙය යන්න කිවහොත් නිවැරදිය. රජකම හෙවත් රාජ්‍යත්වය පැරණි ලංකාවේ වැදගත්ම දේශපාලන සංස්ථාව වේ. අද වන විට මෙය වෙනස්කම් සිදු වුවත් ජනාධිපති ලංකාවේ වැදගත්ම පාලකයා වේ. කාලය වෙනස් වී ගිය ද, රජ යන නාමය වෙනස් වුව ද, පාලකයා සිදුකරන කාර්යය වර්තමානයේ ද, ඉතිහාසයේ ද, එකමය. එසේම පාලකයා ආණ්ඩුවේ නායකයා, රාජ්‍යයේ නායකයා වේ. එදා රජු ප්‍රධාන කර ගත් පාලනය අද ජනාධිපති ප්‍රධාන වු පාලනයක් ඇත. එහෙත් එදා මෙන්ම අද වන විටත් ඔහුට වැඩි බලයක් සහිත ය. ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවේ 30 (1) වගන්තියේ සඳහන් වනුයේ ශ්‍රී ලංකා ජනරජයේ ජනාධිපති වරයෙක් වන්නේය, ජනාධිපතිවරයා රාජයේ ප්‍රධානියා ද, විධායකයේ ප්‍රධානියා ද, ආණ්ඩුවේ ප්‍රධානියා ද, සන්නද්ධ සේනාවන් හි සේනාධි නායකවරයා ද, වන්නේ ය (1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව).

මෙරට ශ්‍රී ලංකාව තුළ පාලන සංවිධාන කීපයක් ආරම්භ වුයේ පණ්ඩුකාභය රජුගේ කාලය තුළය. ගම්නියම් සීමා කරමින් අනුරාධපුර නගරය සිමා තිර්ණය කරන්නට විය. එසේම එම නගර පාලනය කිරිමට නිලධාරීන් පත් කර පාලන කටයුතු භාර දෙන ලදී. සනීපාරක්ෂක කටයුතු සඳහා ද, නිලධාරින් පත් කරන ලදි. මෙරට සංවිධානාත්මක පාලන ක්‍රමයක් ප්‍රථම වරට ඇති කරන ලද්දේ මේ කාලයේ දීය. වර්තමානයේ පළාත් සභා ක්‍රමය, නගර සභා, මහ නගර සභා, ප්‍රාදේශීය සභා බිහිවීමට ද, මෙය හේතුවක් වන්නට ඇත. තව ද, ප්‍රාදේශීය නිළධාරින්, දිස්ත්‍රික් නිළධාරින් වශයෙන් ලංකාව තුළ නිල බල පැලැන්තියක් බිහි වුයේ මෙම කාලයේ වු දේශපාලන වෙනස්වීම නිසා බව කිව හැකිය. මෙහිදී එදා සිදු වු පාලන ක්‍රමයේ රට කොටස් ලෙස බෙදා වෙන්කර පාලනය කිරීම සිංහල පසුව දෙමළ ජාතිය ගැටුමක් ඇති වන්නට හේතු වන්නට වුණි. මෙලෙස අතීතයේ බෙදා පාලනය කිරීම පසුකාලීනව දෙමළ ජනයා ඔවුන්ටම පාලන ක්‍රමක් ඉල්ලා සිටිමට යම් ආකාරයකට බලපාන්නට ඇතැයි සිතිය හැක. දෙමළ ජාතියට විසඳුමක් ලෙස පාළත් පාලන ක්‍රමයක් ඇති කිරිම සිදු කරන ලදි. එහිදී 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 වන ශංශෝධනය මඟින් රට පළාත් 9 කට බෙදා දක්වන ලදි (www.divaina.com).එලෙස බලය විමධ්‍යගත කිරිම ඓතිහාසික පාලන ක්‍රමයෙන් නුතන දේශපාලනයට හා ආණ්ඩු ක්‍රමයට බලපෑමක් වන්නට ඇතැයි නිගමනය කළ හැක.

අනුරාධපුර යුගයේ තවත් දේශපාලන වශයෙන් වැදගත් වන පාලන යුගයක් ලෙස දේවානම්පියතිස්ස රජුගේ පාලන කාලය හැඳින්විය හැකිය. බුදුදහම සමඟ මිහිදු හිමියන් ලක්දිවට වැඩම කිරිම මෙම යුගයේ සිදු විය. රාජ්‍ය පාලනයට ආගම මුහුවීමේ ආරම්භය සිදු වුයේ මෙම කාලයේදීය. එනම් ලාංකීය පාලකයා බෞද්ධයකු වීම මූලාරම්භය සිදුවීමය. මිහිදු හිමි ලංකාවට පැමිණීම සමඟ අනාගමික රාජ්‍ය ආගමික රාජ්‍ය බවට පරිවර්තනය විය. වර්තමානයේ අද වන විට ආගමික රාජ්‍යක් ලෙස නම් කරනුයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන්මය. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ (9) වගන්තියෙන් එය දක්වා ඇත. එහි ශ්‍රී ලංකා ජනරජය බුද්ධාගමට ප්‍රමුඛස්ථානය පිරිනමන්නේ ය ( යන්න සදහන් වේ (ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව 1978) . එදා ශ්‍රී ලංකා භික්ෂුන් වහන්සේ දේශපාලන වශයෙන් පාලකයාට අවවාද අනුශාසනා කරන උපදේශකයා විය. එසේම භික්ෂුන් වහන්සේලා වර්තමානයේ ද දේශපාලඥන් සඳහා අවවාද අනුශානා කිරිම සිදු කරනු ලබයි. අද ජනාධිපතිතුමාට අනුශාසනා උපදෙස් දෙනු ලබන්නේ මල්වතු අස්ගිරි පාර්ශවය විසිනි. මෙයින් දේශපාලනමය වශයෙන් පාලකයා යුක්තිගරුක, අවිහිංසාවාදි බෞද්ධ සංකල්ප වලට අනුව පාලනය කිරිමට යොමු කිරිමට හැකි වේ. යහපත් පාලකයකු මෙයින් බිහිවේ. නමුත් අන්ත ආගමිකවාදී උපදේශක භික්ෂුන් පාලකයා තම අරමුණු වෙනුවෙන් යොමු කරවා ගැනීම මෙහි ලැබෙන අහිතකර බලපෑම වේ. දේශපාලන වශයෙන් සිදු වු මෙම බලපෑම ශ්‍රී ලංකා දේශපාලනය තුළ ගැටුම් ගණනාවක් ඇති විමට ද හේතු විය. සිංහල දෙමළ, සිංහල මුස්ලිම්, ආගමික ගැටුම් ඇති වුයේ ව්‍යවස්ථාව මඟින් බුදුදහමට ප්‍රධාන තැනක් දීම නිසාය. වර්තමානයේ සිදුවන ගැටුම් දෙස බලන විට එදා සිදුවු ඒ

දේශපාලන පෙරලිය දේශපාලන වශයෙන් අහිතකර තත්ත්වක් ලෙස ද, ලංකා දේශපාලන සිදුවීම් දෙස බලන විට මනාව පිළිඹිබු වේ. එනම් මෑතකාලිනව ආගමික වශයෙන් දේශපාලන පක්ෂ සංවිධාන බිහි කරගෙන ඇත. බොදු බලසේනාව. රාවනා බලය. මුස්ලිම් කොන්ග්‍රසය වැනි පක්ෂ හා සංවිධාන බිහිකර ගනිමින් ජාති ආගම්වාදිව බේද ඇත්තේ එදා සිදු වූ දේශපාලන ආගම මුහුවීම නිසා බව පෙන්වා දිය හැක. උදාහරණ ලෙස මෑත කාලීනව අලුත්ගම සිදු වූ ආගමික කණ්ඩායම් අතර ගැටුම, මුස්ලිම් දේවස්ථාන විශාල ප්‍රමාණයකට ප්‍රහාර එල්ල කර ඇති බවට රවුෆ් හකීම් බෞද්ධයන්ට විරුද්ධව නඩු පැවරීම, හලාල් ගැටුම, ශ්‍රී පාදය පාදක කරගත් ප්‍රශ්නය, ලංකාවේ ෂරියා නීතිය අහෝසි කිරීම සම්බන්ධ ගැටුම්, ආගමික සිද්ධස්ථාන විනාශ කිරීම සම්බන්ධ ගැටුම් සිදු වුයේ ආගමික හේතු නිසාය (www.divaina.). ලංකාව වැනි රටකට එක් රටක් ජාතියක් වශයෙකන් ගොඩ නොනැගිය හැක්කේ විවිධ ආගම් අදහන ජනතාවක් ජීවත් වන විට එකම ආගමක් රාජ්‍ය ආගම කර ඇති නිසාය. ජාති, ආගම් වශයෙන් බේදීම් නොතිබි යුතුය (www.divaina.lk). රාජ්‍ය භාණ්ඩාගාරයෙන් ආගමික සංවර්ධනය උදෙසා මුදල් වැය කිරිමට ද අද වන විට සිදුව ඇත.මෙය යම් ආකාරයක රටක සංවර්ධනය උදෙසා ඇති ධනය වේ. ඇමරිකාව වැනි රටවල්වල ආගම යන්න දේශපාලනයෙන් දික්කසාද කර ඇත. එම නිසා ආගමික ගැටුම් එවැනි රටවල නොමැති තරම් ය. විශේෂයෙන් ආගමක් වෙනුවෙන් මුදල් ප්‍රතිපාදන වෙන් කිරිමට අවශ්‍ය වන්නේ නැත. සියළු ආගම් වලට සමාන ඉඩ ප්‍රස්ථා ලබා දී ඇත. නමුත් ලංකාවේ එදා මිහිදු හිමියන් විසින් පාලකයා බෞද්ධයකු කිරීම තුළින් හා අනෙකුත් ක්‍රියාමාර්ග මඟින් පාලනයට ආගම එක් කිරිම වර්තමානය වන විට හොඳට මෙන් ම නරකට ද, බලපා ඇත.

අනුරාධපුර යුගයේ තවත් වැදගත් පාලන ක්‍රමයක් වන්නේ දුටුගැමුණු රජුගේ පාලන සමයයි. දේශපාලනමය වශයෙන් රටම එක්සේසත් කළ පාලන කාලයක් ලෙස මෙම කාලය හැඳින්විය හැකිය. එළාර රජු පරදවා විදේශ ආක්‍රමණ වලින් රට බේරාගත් පාලන කාලයක් ලෙස මෙම යුගය හැඳින්විය හැකිය. විධිමත් ආකාරයට රාජ්‍ය පරිපාලන ප්‍රදේශ බෙදා මෙම යුගයේ පාලනය ගෙන යන ලදි. පණ්ඩුකාභය රජු දවස රට පරිපාලන කොටස්වලට බෙදා වෙන් කිරිම දුටුගැමුණු රජුගේ පාලන කාලයට ද බලපාන ලදි. එසේම පාලකයා බෞද්ධයකු වීම සංඝයා වහන්සේලාගෙන් අනුසාසනා ලබා ගැනීම මෙම කාලය තුළ ද, ක්‍රියාත්මක විය. යුද්ධයේදි මහා සංඝයා ප්‍රමුඛ කරගැනීමෙන් ඒ බව පැහැදිළි වේ. යුද්ධය ආදි අවස්ථාවලදි රාජ්‍ය නායකයා ඓතිහාසික යුගයේ භික්ෂුන් පෙරදැරි කරගන සතුරු ආක්‍රමණ සඳහා මුහුණ දි ඇත. වර්තමානය තුළ ද, එසේමය. රාජ්‍ය තුළ එදා භික්ෂුන් සඳහා පැවති ගෞරවය භක්තිය අද ද, එසේමය. ත්‍රස්තවාදි යුද්ධය හමුවේ මහින්ද රාජපක්ෂ ජනාධි පතිගේ පාලන කාලයේ ත්‍රස්තවාදය පරාජය කිරිම සඳහා භික්ෂුන් පෙරමුණ ගෙන ඇති බව දැක ගත හැකිය. දුටු ගැමුණු පාලන කාලය තුළ විශේෂයෙන් සිදු වු දෙයක් නම් යුක්තිය පසිඳලීම සඳහා අවශ්‍ය අධිකරණ ශාලා හා විනිශ්චයකරුවන් පත් කළ බව සඳහන් වේ (රණවැල්ල, 2009, 150). මෙය අද දක්වාම ක්‍රියාත්මක වේ. අධිකරණ ස්වාධිනතාවය නීතියේ ආධිපත්‍ය සංකල්පය එම යුගයේ සිට වර්තමානය දක්වා ක්‍රියාත්මක වී ඇත. වර්තමානයේ එම සංකල්ප ක්‍රියාත්මක කිරීම රාජ්‍යයේ වගකීමක් බවට පත්ව ඇත. ප්‍රජාතන්තවාදි පාලන ක්‍රමයේ ආරම්භය ඓතිහාසික වශයෙන් මෙම යුගයේ සිදු වු වැදගත් සිදු වීමකි. ප්‍රජාතන්ත්‍රවාදි පාලනයකට අවශ්‍ය කරන සියලු අංග මෙම යුගයේ පාලන ක්‍රමය තුළ ඇති කර ඇත. වර්තමානයේ පවතින ප්‍රජාතන්ත්‍රවාදි පාලන ක්‍රමයට අවැසි පදනම මෙතැනින් සිදු වන්නට ඇතැයි කිව හැකිය.

වට්ටගාමණී අභය රජු හෙවත් වළගම්බා රජුගේ කාලය ද, දේශපාලනමය වශයෙන් වැදගත් කාල පරිච්ඡේදකි. ද්‍රවිඩ නායකයන් පරදා රට එක්සේසත් කළ රජුකු ලෙස වළගම්භා රජු හැඳින්විය හැක. මේ ආකාරයට එදා සිටම ආක්‍රමණ යුද කෝලහාල පැවත ඇත. අද ද, එසේමය. ශ්‍රී ලංකාවේ දරුණුතම යුද්ධය වන එල්.ටී.ටී.ඊ යුද්ධය අවසන් කර රට එක්සෙසත් කරන ලද්දේ මහින්ද රාජපක්ෂ ජනාධිපති වරයා විසිණී. . එය ලංකා ඉතිහාසයට එක් වන්නකි. රජුගේ පාලන කාර්යයන්හි දී අමාත්‍යවරුන් ඉසිලුවේ අතිශයින්ම වැදගත් ස්ථානයකි වර්තමානයේ ද එසේමය. ඇමති මණ්ඩලයක් විසින් පාලන කටයුතු මෙහෙයවනු ලබයි. විවිධ විෂයන් ඔවුන්ට එදා මෙන්ම අදත් පවරා දී ඇත. තවද අය බදු එකතු කිරීම වැනි බදු ප්‍රතිපත්ති එදා මෙන්ම වර්තමානයේ ද, එලෙසම පවති. දේශපාලන වශයෙන් වැදගත් සිදුවීමක් ලෙස ප්‍රථම වරට කාන්තාවක් රාජ්‍ය පාලනය කරනු ලබන්නේ අනුරාධපුර යුගයේදීය. එම බලපෑම වර්තමාන දේශපාලනය ගොඩනැඟීමට බලපා ඇත.

එනම් කාන්තාවක් වශයෙන් සිරිමාවෝ බණ්ඩාරනායක මැතිණිය, චන්ද්‍රිකා කුමාරතුංග වැනි කාන්තාවන් රාජ්‍ය පාලකයන් වී ඇත. කාන්තාවන් ව්‍යවස්ථාදායකය නියෝජනය කර ඇත. මෙහි මූලාරම්භය අනුරාධපුර යුගය වේ. මේ ආකාරයට මෙරට අනුරාධපුර යුගයේ දේශපාලන ඉතිහාසය වර්තමානයේ දේශපාලන හා ආණ්ඩු සංස්ථාව ගොඩනැඟීමට බල පා ඇති බව මනාව තෙරුම් ගත හැකිය.

## නිගමනය

මුල් කාලයේදී ගෝත්‍රයක හෝ ගෝත්‍ර කිහිපයක නායකයා රජු ලෙස හැඳින් විය. රාජ්‍යයන්ගේ බිහිවීම පිළිබඳව බෞද්ධ හා හින්දු පොත්පත් වල ද, සඳහන් වේ. රට වැසියා හා රජු අතර කිසියම් සම්මුතියක් ඇති කරගනු ලැබූ අතර රජු දෙවියන්ගේ සහෝදරයා විය. ශ්‍රී ලංකාවේ රාජ්‍ය ආයතන ආරම්භ වූයේ විජයාගමනයෙනි. නමුත් ඊට පෙර මෙරට රාජ වංශ පිළිබඳ සංකල්පය පැවති බවට සාක්ෂි පවතී. ශ්‍රී ලංකාව තුළ රජෙකු යටතේ පාලන සංවිධානක් මුලින්ම ආරම්භ වූයේ " පණ්ඩුකාභය" රජුගේ කාලයේය. තවත් වැදගත් රාජ්‍ය පාලන අවස්ථාවක් වන්නේ " දේවානම්පියතිස්ස" රජුගේ පාලන සමයයි. ලංකාවට විශාල මෙහෙවරක් දේශපාලනමය වශයෙන් ඔහු සිදු කරන ලදි. මෙකල සිදු වූ වැදගත්ම සිදුවීම වන්නේ ලංකාවට බුදුදහම ලැබීමය. බුදු දහම දේශපාලනයට සම්බන්ධ වූයේ එතැන් පටන් ය. එය අදටත් ලංකාවේ දේශපාලනය ගොඩ නැඟීමට බලපා ඇත. ලාංකීය පාලකයා බෞද්ධයකු විය යුතු වීම එයට හොඳම නිදසුන වේ. ශ්‍රී ලංකාව පුරාම දේශපාලන ආධිපත්‍ය දිනා ගැනීමට හැකි වූයේ "දුටුගැමුණු" රජුට ය. ඔහුගේ පාලන ක්‍රමය තුළින් ලංකාව එකීය රටක් බවට පත්වීම නිසාම වර්තමානය තුළ පවා ලංකාව තුළ ඒකීය රටක් ගොඩ නැඟීමේ සංකල්පය ක්‍රියාත්මක වේ. වර්තමානයේ ද, දේශපාලන සංකල්ප හා ආණ්ඩු ගොඩනැගීම සඳහා එදා අනුරාධපුර යුගයේ පැවති රාජ්‍ය පාලනය තුළින් ගොඩ නැගුණු දේශපාලන හා ආණ්ඩුකරණය වැනි සංකල්ප හේතු වි ඇති බව කිව හැකි ය

## ආශ්‍රිත ග්‍රන්ථ

කුමාරතුංග.ඩී.පී., 1997. *ශ්‍රී ලංකාවේ ඉතිහාසය*, කොළඹ: අභය මුද්‍රණ ශිල්පියෝ.

මොරටුවගම එච්.එම්., 1997. *ශ්‍රී ලංකාවේ සංස්කෘතික උරුමය*, නුගේගොඩ: සදීපා පොත්හල

සෝමරත්න පී.වී.පි., 2007. *ශ්‍රී ලංකාවේ ඉතිහාසය පළමුවය කොටස අනුරාධපුර යුගය*, බත්තරමුල්ල: අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව, 1978

මහාවංසය

www.divaina.com

www.sarasavi.lk